# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් **2020.09.14** දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. <u>තාක්ෂණික නිලධාරී (II ශ්‍රේණිය) "අ" ඛණ්ඩය</u>

**සුදුසුකම් :**

1. ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ ඒ හා සමාන සුදුසුකම්

හෝ

2. ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව

හෝ

3. අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ වන උසස් ජාතික ඩිප්ලෝමාව

හෝ

4. අදාළ විෂය ක්ෂේත්‍රයට අදාලව වසර දෙකක (02) පූර්ණ කාලීන ඩිප්ලෝමාව සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසරක (01) පළපුරුද්ද.

**සටහන :** තනතුරේ ස්වභාවය අදාළ ක්ෂේත්‍ර වශයෙන් කෘෂිකර්ම / සත්ව පාලනය / ඉංජිනේරු / විද්‍යා / තාක්ෂණය / වෛද්‍ය රසායනාගාර තාක්ෂණය ආදී වේ. කෙසේ වෙතත් අදාල ක්ෂේත්‍රයේ පිළිගැනීම තීරණය කරනුයේ අදාල පීඨය විසිනි.

**වැටුප් පරිමාණය :** U-MT 1(II)
Rs. 35145-7×355 ; 9×495 - 42085 (මාසික)

**බඳවා ගැනීම** : ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** : අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 2. <u>තාක්ෂණික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය</u>

**සුදුසුකම් :-**

1. අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතීය විද්‍යා විෂය ධාරාවන් යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත්වී තිබිය යුතුය.

සහ

2. සිවිල් ඉංජිනේරු හෝ ඊට සමාන ක්ෂේත්‍රයක පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් මගින් ලබා ගත් තෘතීයික හා වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම (NVQ Level 5) හෝ ඊට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :-** U-MT 1(III A)
රු. 31625 - 7x300 ; 10x355- 37275 (මාසික)

**බඳවා ගැනීම** :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය

## 3. තාක්ෂණික නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණිය

**සුදුසුකම් :-**

1. අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතිය විද්‍යා විෂය ධාරාවන් යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත්වී තිබිය යුතුය.

සහ

2. යාන්ත්‍රික ඉංජිනේරු හෝ ඊට සමාන ක්ෂේත්‍රයක පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් ලබා ගත් තෘතියික හා වෘත්තීය සුදුසුකම 5 වන මට්ටම (NVQ Level 5) හෝ ඊට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :-** U-MT 1(III A)
රු. 31625 - 7x300 ; 10x355- 37275 (මාසික)

**බඳවා ගැනීම** :- ලිඛිත හා /හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

## 4. හෙද නිලධාරී (III ශ්‍රේණිය)

**සුදුසුකම් :-**

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

2. හෙදියක් වශයෙන් ප්‍රවීණතාවය ලබා ඇති බවට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් හෙද ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.

**වැටුප් පරිමාණය :-** U-MT 1(III A)
රු. 31625 - 7x300 ; 10x355- 37275 (මාසික)

**බඳවා ගැනීම** :- ලිඛිත හා/හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

## 5. කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය) / (ගබඩා භාරකරු)

**සුදුසුකම් :-**

(1) අ.පො.ස (සා/පෙළ) විභාගයේදී
- සිංහල භාෂාව/දෙමළ භාෂාව
- ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- ගණිතය

යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 ක් එක් වරකදී සමත් වී තිබීම.

සහ

(2) අ.පො.ස (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයන් සමත් වීම
(සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

සහ

(3) ගබඩාකරණය පිළිබඳ එක් අවුරුදු පළපුරුද්දක් සහ/හෝ අ.පො.ස (සා/පෙළ) විභාගයේ වාණිජ්‍යය විෂය සමත්වීම හෝ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ගණකාධිකරණ විෂය සමත්වීම.

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

1. පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ සුදුසුකම්
2. පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ වසර 02 ක පළපුරුද්ද

සටහන :- **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනය විසින් තීරණය කරනු ලබන පරිදි ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුය.**

වැටුප් පරිමාණය :- U-MN 1(IIIA)
රු. 30725-17x 300-35825 (මාසික)

බඳවා ගැනීම :- ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වයස :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**6. <u>වැඩ අධිකාරී (සිවිල්) II ශ්‍රේණිය</u>**

**සුදුසුකම් :-**

1. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතික පත්‍රය (NDT) හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රය පිළිබඳව අවුරුදු 04 ක පළපුරුද්ද.

   ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ අවුරුදු 04 හි පුහුණු කාලසීමාව ඉල්ලුම් කරනු ලබන පළපුරුද්දට අදාළ නොවේ.

හෝ

2. ජාතික තාක්ෂණ සහතික පත්‍රය (NCT) හෝ ඊට සමාන සුදුසුකම් සහ එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 10 ක පළපුරුද්ද.

වැටුප් පරිමාණය :- U-MN 2(II)
රු. 37275 – 18x495 – 46185 (මාසික)

බඳවා ගැනීම :- සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

වයස :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**7. <u>වැඩ පරිපාලක (විදුලි) III ශ්‍රේණිය</u>**

**සුදුසුකම් :-**

1. ජාතික තාක්ෂණ සහතිකය (විදුලි) හෝ සමාන සුදුසුකම් සමඟ අවුරුදු තුනක (03) සේවා පළපුරුද්ද (ජාතික තාක්ෂණ සහතිකය පාඨමාලාව හැදෑරීමේ කාලය තුලදී ලබා තිබීම ප්‍රමාණවත් වේ. )

හෝ

2. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් හයක් සමත්වී තිබීම හා රජයේ දෙපාර්තමේන්තුවක, පළාත් පාලන ආයතනයක, රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක අදාල ක්ෂේත්‍රයේ පරිපාලකවරයෙකු වශයෙන් අවුරුදු පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.

වැටුප් පරිමාණය :- U-MT 1(IIIA)
රු. 31625 – 7x300; 10x355 – 37275 (මාසික)

බඳවා ගැනීම :- වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

වයස :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**8. <u>වෘත්තීය ශිල්ප ප්‍රදර්ශක III ශ්‍රේණිය (යාන්ත්‍රික) / වෘත්තීය ශිල්ප ප්‍රදර්ශක III ශ්‍රේණිය (වෑද්දුම්).</u>**

**සුදුසුකම් :-**

1. පහත සඳහන් ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි ගණනක පලපුරුද්ද තිබිය යුතුය. (වාත්තු වැඩ, පැස්සුම් සහ කම්හල් වැඩ, යාන්ත්‍රික උපාංග, රථා සැකසීම, තහඩු වැඩ, වඩු වැඩ, ලෝහ වැඩ)

   සටහන : ඉහත සඳහන් ක්ෂේත්‍රයන්ගෙන් එකකට වැඩි ගණනක් සඳහා පළපුරුද්ද ඇති අය කෙරෙහි ප්‍රමුඛත්වය දක්වනු ලැබේ.

සහ

(අ) විශ්වවිද්‍යාල / රාජ්‍ය සේවයේ හෝ පිළිගත් ආයතනයක පුහුණු ශිල්පියෙකු ලෙස අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද ලබා තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාලයක, රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් ආයතනයක අවම වසර තුනක කාලයක් විශේෂ ශ්‍රේණියේ පුහුණු ශිල්පියෙකු ලෙස සුදුසුකම් එක (I) යටතේ සේවයේ යෙදී තිබීම.

**වැටුප් පරිමාණය :-** U-MN 1(IIIA)
රු. 30725 – 17x300 – 35825 (මාසික)

**බඳවා ගැනීම** :- වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**9. <u>නිදර්ශක එකතු කරන්නා (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

1. අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ භාෂාව සහ විද්‍යාව ඇතුලුව විෂයයන් හයකින් (06) සමත්වීම.

2. අ.පො.ස. (උ/පෙළ) විභාගය ජීව විද්‍යාව විෂය ධාරාව හදාරා තිබීම.

3. ශාක නිදර්ශක එකතු කිරීම සහ හඳුනා ගැනීමේ පළපුරුද්ද සහිතව උද්භිද උද්‍යානයක හෝ කෘෂිකාර්මික ගොවිපලක / පැල තවානක වසර 2 ක පළපුරුද්ද

කණිෂ්ඨ සේවකයින් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ ඉහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම.

හෝ

*ශාක විශේෂ, නිදර්ශක සංරක්ෂණය, පැල තවාන් සංවර්ධනය සහ විද්‍යාගාර වැඩ පිළිබඳ දැනුමක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය :-** U-PL 2(III)
Rs. 28025 - 16×270 - 32345 (මාසික)

**බඳවා ගැනීම :-** වෘත්තීය හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**10. <u>වඩු කාර්මික (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

1. ලිවීමට සහ කියවීමට ඇති හැකියාව.

2. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණත්වය -

   (අ). ගොඩනැගිලි හා ගෘහ භාණ්ඩ කර්මාන්තය සම්බන්ධ වඩු වැඩවලදී පාවිච්චි වන නොයෙකුත් පිරිද්දුම් සකස් කිරීම;

   (ආ). නොයෙකුත් අන්දමේ වඩු ආයුධ සහ නොයෙකුත් අන්දමේ දැව වර්ග පාවිච්චිය හා සැළසුම් කියවීම;

   (ඇ). අඟලෙන් 1/32 දක්වා පරිමාණයන් නිවැරදිව කියවීම.

3. වඩු කාර්මාන්තය පිළිබඳව වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

සටහන :- හත්වන ශ්‍රේණිය සමත් අපේක්ෂකයින්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

**වැටුප් පරිමාණය :-** U-PL 3(III)
රු. 29915 – 16x270 – 34235 (මාසික)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 11. වැද්දුම්කරු (III ශ්‍රේණිය)

**සුදුසුකම්:-**

1. ලිවීමට සහ කියවීමට හැකියාවක් තිබීම.

2. මිනුම් උපකරණවල අඟලෙන් 1/64 දක්වා පරිමාණයන් කියවීමේ හැකියාව සහ භාග සංඛ්‍යා මිනුම් අනුපාත සටහන් කරගැනීමේ හැකියාව, ඉංජිනේරුමය ඇඳීම් කියවීමේ හා තේරුම් ගැනීමේ හැකියාව, වාෂ්ප මෝටර් හා ඩීසල් බලයෙන් ක්‍රියා කරන යන්ත්‍ර සහ ගවර්නර් ආදියෙහි නොයෙකුත් අන්දමේ වැද්දුම් සකස් කිරීමේ සහ සූක්ෂම මානක කියවීම පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

3. රජයේ දෙපාර්තමේන්තුවක රාජ්‍ය සංස්ථාවක හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක වැද්දුම්කරුවකු වශයෙන් අවුරුදු 2 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :-** U-PL 3(III)
රු. 29915 – 16x270 – 34235 (මාසික)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 12. ගබඩාකරු (III ශ්‍රේණිය)

**සුදුසුකම් :-**

1. (අ). දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ සහ ගණිතය යන විෂයන් සහිතව අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත් වීම.

හෝ

(ආ). 8 ශ්‍රේණිය සමත්වීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක අවමය වසර 10 ක පළපුරුද්දක් තිබීම.

2. පිළිගත් ගබඩාවක අවම වශයෙන් වසර 05 කට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය

**වැටුප් පරිමාණය :-** U-PL 1(III)
රු. 27025 – 15x250 – 30775 (මාසික)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය

## 13. පෑස්සුම්කරු (III ශ්‍රේණිය)

**සුදුසුකම් :-**

1. ලිවීමට හා කියවීමට හැකියාවක් තිබීම.

2. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණත්වය -

   (අ). අඟලෙන් 1/32 දක්වා පරිමාණයන් කියවීම, සරල ඇඳීම් කියවා තේරුම් ගැනීම, පෑස්සීම සඳහා නොයෙකුත් වැඩ පිළියෙල කිරීමේ ක්‍රම, හේත්තු, අත්වැස්ම, පිරිපටි, මුළු පිළියෙල කර නිමකිරීම හා වෙනත් අන්දමේ පෑස්සුම්.

   (ආ). ඉලෙක්ට්‍රෝඩ්ස් හා නොයෙකුත් ප්‍රමාණයයෙන් භාවිතයට ගන්නා විවිධ කොටස් හා ද්‍රව්‍ය වල බල පාලනය. තිරස්, සිරස් හා හිස මට්ටමමෙන් ඉහළ පෑස්සුම්.

   (ඇ). ක්ලිප් කිරීම හා මනා නිමාවක් ලැබෙන සේ පිරවීම, අසිටලින ජනකය භාවිතා කිරීමේ නිවැරදි ක්‍රමය හා එහි පිරියත වල සුළු දෝෂයන් හඳුනා ගැනීම හා ඒවා නිවැරදි කිරීම, වායු සිලින්ඩර් නිවැරදිව භාවිතා කිරීම පිළිබඳ දැනුම.

3. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ඉංජිනේරු ආයතනයක පෑස්සුම්කරුවෙකු ලෙස වසර 02කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය :-** U-PL 3(III)
රු. 29915 – 16x270 – 34235 (මාසික)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**14. <u>යාන්ත්‍රික ශිල්පී (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

1. 7 ශ්‍රේණිය සමත්වීම.

2. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණත්වය -

    (අ). අඟලෙන් 1/64 දක්වා පරිමාණයන් කියවීම හා මයික්‍රොමීටර සැකසීම.

    (ආ). ශිල්පයට අදාළ සියලු මෙවලම් සහ ඇමුණුම්, නම් කිරීම, භාවිතය සහ නඩත්තු කිරීම.

    (ඇ). කාර්යයට අදාළ සියලුම ඇඳීම් කියවීම හා තේරුම් ගැනීම.

    (ඈ). යන්ත්‍ර දක්ෂ ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාව. (උදාහරණ : විදින යන්ත්‍රය, හැඩ ගැසීම යන්ත්‍ර, ග්‍රයින්ඩර් යන්ත්‍ර හා ලේත් යන්ත්‍ර)

3. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ඉංජිනේරු ආයතනයක පින්තාරු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය :-** U-PL 3(III)
රු. 29915 – 16x270 – 34235 (මාසික)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**15. <u>පින්තාරුකරු (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

1. ලිවීමට හා කියවීමට හැකියාවක් තිබීම.

2. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණත්වය -

    (අ). ගොඩනැගිලි ඉදිකිරීමේදී හා නඩත්තු කිරීමේදී කරනු ලබන පින්තාරු වැඩ.

    (ආ). සියලුම සුප්‍රසිද්ධ සහ සාමාන්‍ය හිමිකම් සහිත පින්තාරු වර්ග, සියලුම වර්ග වල ද්‍රව්‍ය, විවිධාකාර මතුපිටවල් පිළියෙල කර ගැනීම සහ ඉතාම නිවැරදි නිමාවට එන තෙක් තෝරාගත් ද්‍රව්‍ය සියළුම පියවර වලදී නිවැරදි ලෙස යොදා ගැනීම.

    (ඇ). විවිධ අන්දමේ මිශ්‍රණයන් සහ පින්තාරු ද්‍රව්‍ය නියමිත පරිදි ගබඩා කර තැබීම.

    (ඈ). උපකරණ පාවිච්චිය සහ ඒවායේ පිරිමැස්ම සහිත නඩත්තුව යන කරුණු පිළිබඳව දැනුමක් තිබිය යුතුය.

3. රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ ඉංජිනේරු ආයතනයක පින්තාරු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

**වැටුප් පරිමාණය :-** U-PL 2(III)
රු. 28025 – 16x270 – 32345 (මාසික)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**16. <u>ජලනල කාර්මික (III ශ්‍රේණිය)</u>**

**සුදුසුකම් :-**

1. ලිවීමට හා කියවීමට හැකියාවක් තිබීම.

2. පහත සඳහන් කරුණු පිළිබඳ නිපුණත්වය -

(අ). අඟලෙන් 1/64 දක්වා පරිමාණයන් කියවීමට හැකියාව සහ ආයුධ නඩත්තු කිරීම හා ඒවායේ වත්මන් භාවිතය පිළිබඳ දැනුම.

(ආ). සී.අයි (C.I.) සහ ජී.අයි (G.I). සහ ඊයම් පයිප්ප ඇතුළුව විවිධ පිරිද්දුම් පිළිබඳ දැනුම හා ඒවා පරීක්ෂා කිරීම පිළිබඳ දැනුම.

(ඇ). බෝල වැල්, ජල භාජන ආදිය අළුත්වැඩියා කිරීම සහ සරල ඇඳීම් සටහන් කියවීමට හා තේරුම් ගැනීමට ඇති හැකියාව.

3. ජලනල කාර්මික කටයුතු පිළිබඳ වසර 02 කට නොඅඩු පළපුරුද්දක් තිබීම.

සටහන :- හත්වන ශ්‍රේණිය සමත් අපේක්ෂකයින්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

**වැටුප් පරිමාණය :-** U-PL 3(III)
රු. 29915 – 16x270 – 34235 (මාසික)

**බඳවා ගැනීම** :- වෘත්තීය පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## 17. ක්‍රීඩාගාර සහායක (III ශ්‍රේණිය) – Gymnasium Attendant (Grade III)

**සුදුසුකම් :-**

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස (සා/පෙළ) විභාගය විෂයන් 06 කින් සමත් වීම.

2. ක්‍රීඩාගාරයක ඇති උපකරණ සම්බන්ධයෙන් දැනුමක් තිබිය යුතු අතර ඒවා හැසිරවීම හා නඩත්තුව සම්බන්ධයෙන් දැනුම තිබිය යුතුය.

3. ක්‍රීඩාගාරයක් නඩත්තු කිරීම සම්බන්ධයෙන් වසර දෙකකට (02) නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය.

4. ගෘහස්ථ ක්‍රීඩා සම්බන්ධයෙන් දැනුමක් තිබිය යුතුය. (අත්පන්දු, බැඩ්මින්ටන්, පැසිපන්දු, මේසපන්දු වැනි.)

**වැටුප් පරිමාණය :-** U-PL 2(III)
රු. 28025 – 16x270 – 32345 (මාසික)

**බඳවා ගැනීම** :- යෝග්‍යතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**වයස** :- අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**අයදුම්පත් එවිය යුතු ආකාරය :**

- සෑම අයදුම්පතක්ම මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කොට අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික පිටපත්ද සමඟ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන අංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට 2020.09.14 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- විශ්වවිද්‍යාල සේවයේ/රජයේ දෙපාර්තමේන්තුවක/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

- අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

(කේ. ජී. බ්‍රිටෝ)
ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2020.08.26